# බලංගොඩ බෙලිගල රජමහා විහාරය



නුවර යුගයේ ඉදි කළ බුද්ධ ප්‍රතිමාව

සුනිල් අත්තනගොඩ
බළන්ගොඩ - සංචාරක

සොබා දහමේ සුන්දරත්වයෙන් අනූන, නිහඬ වන පියසක පිහිටි, බෞද්ධ බැතිය තීව්‍ර කැරෙන පුදසුනක් හැටියට රත්නපුර දිස්ත්‍රික්කයේ, බලන්ගොඩ මැතිවරණ කොට්ඨාසයේ, පල්ලේකන්ද ග්‍රාමසේවා වසමෙහි පිහිටි ඓතිහාසික බෙලිගල රජමහා විහාරස්ථානය හැඳින්විය හැකිය.



සණ්ඨාර කුළුණ

ක්‍රි. පූ. පළමුවැනි සියවසේ දී පමණ "වට්ට + ගාමිණී +අභය" (වළගම්බා රජතුමන්) විසින් මෙම විහාරස්ථානය ගොඩ නංවන ලද බව සැලකිය හැකිය. සුවිසාල ගල්පතය මධ්‍යයේ කටාරම් කොටන ලද විහාර මන්දිරය සහ අඩි 22 ක් දිගැති සැතපෙන බුද්ධ ප්‍රතිමාව එයට හොඳම සාක්ෂියකි.

කොළඹ - බදුල්ල ප්‍රධාන මාර්ගයේ 138 වැනි කිලෝ මීටර් කණුව පසුකරද්දී හමුවන පල්ලේකන්ද ග්‍රාමයෙන් ද, ඉන් කිලෝ මීටරයක් ඔබ්බෙහි (139) පිහිටි ඇල්ලේපොළ ග්‍රාමයෙන් ද මෙම බෙළිගල රජමහා විහාරස්ථානයට පැමිණිය හැකිය.

කටාරම් කොටන ලද ලෙන් විහාරය තුළ පිහිටි සැතපෙන බුද්ධ ප්‍රතිමාවට අමතරව, නුවර යුගයේ දී මෙම විහාර මන්දිරයට "වීරාසන" මුද්‍රාවට අයත් බුද්ධ ප්‍රතිමාවක් ද එක් වී තිබේ. එම බුද්ධ ප්‍රතිමාව දෙපස විෂ්ණු, සමන්, දේව ප්‍රතිමා ද නිර්මාණය කර ඇත්තේ විහාරස්ථානයෙහි පෞඪත්වයට ආරක්ෂාවක් එක්වීමට යයි සැලකිය හැකිය. මෙම ලෙන් විහාරයෙහි පියස්සෙහි නිරූපිත නෙළුම් මල් රටාවන් ද, බිත්තියෙහි නිරූපිත සත්සතිය ඇතුලු බිතුසිතුවම් ද අද වන විට සායම් ආලේප ගැලවී විනාශ වී යන තත්ත්වයක් උද්ගත වී ඇති බව විහාරාධිපති බළන්ගොඩ සුමන හිමියෝ පවසති.

ගැමියන්ගේ දෛනික අවශ්‍යතාවන්වල දී මෙම විහාරස්ථානයෙහි පිහිටි බෝධියට භාරහාරවීම පුරාණයේ සිට අද දක්වාම අඛණ්ඩව සිදු වේ. විහාරස්ථානයට මීටර් 20 ක් පමණ ඔබ්බෙහි පිහිටි ඖෂධ පොකුණ ද දරු ඵල නොමැති මව්වරුන්ගේ දරු ඵල අවශ්‍යතාවයන් සපුරාලීමට හැකියාවක් ඇති අසිරිමත් පොකුණක් ලෙස කියැවෙයි. දැඩි නියඟයක දීවුව මෙහි ජලය නොසිඳී පැවතීම ද එයට හොඳම සාක්ෂියකි.

වළගම්බා රජතුමන් විසින් ජල ස්නානය කළැයි කියන කැටයම් සහිත ගලින් නිම වූ දිය පොකුණ නිධන් හොරුන්ගේ ග්‍රහණයට නතුවීමෙන් මේ වන විට වැනසී ගොස් තිබේ. මෙම විහාර මන්දිරයෙහි පැරණි දේවාලය පිහිටි ;කාටසේ ඇති කළු ගල ලියලෙන බවක් ද කියැවේ.

වත්මන් විහාරාධිපති බළන්ගොඩ සුමණ හිමිපාණන් වහන්සේ මෙහි අධිපතිධුරයට පත්වූවාට පසුව මෙම ස්ථානයට සුවිශේෂී මෙහෙවරයන් සිදු වී ඇති බවට හොඳම සාක්ෂි හැටියට විහාර වහළය සකස් කිරීම, බිත්ති සකස් කිරීම, බෝධීන් වහන්සේ වටා අටවිසි බුද්ධ කුටි ඉදි කිරීම, බෝධි ප්‍රාකාරය, ආරක්ෂිත බැම්ම, සණ්ඨාර කුළුණ වැනි අංග එක්වීම ද සඳහන් කළ හැකිය.




බෙලිගල රජමහා විහාර දසුන.



විහාර මන්දිරයේ සත් සතිය සහිත බිතු සිතුවමක්



ඉපැරැණි ධර්ම ශාලාව

නිසි පරිදි මාර්ග පහසුකම් නොතිබීම නිසාදෝ කොළඹ - බදුල්ල ප්‍රධාන මාර්ගයට සමීපව පිහිටියත් මෙහි පැමිණෙන දෙස් විදෙස් සංචාරක බැතිමතුන්ගේ සංඛ්‍යාව ද අල්පය. මෙම විහාරස්ථානයෙහි කටාරම් කොටන ලද ලෙන් විහාරයෙහි පිහිටි බිතු සිතුවම් මතු පරපුරේ ප්‍රයෝජනය සඳහා ආරක්ෂා කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් යෙදීමට වගකිව යුතු අයගේ අවධානයට ලක් නොවීම ද කණගාටුවට කරුණකි.

නිසල වන පියසක බෞද්ධ බැතිය වඩවන පුදසුනක චාරිකාවකට ඔබට ද ඇරයුම් කරමි.